අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2013
පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය.

ආර්ථික විද්‍යාව I | පැය දෙකයි.

සකස් කිරීම :- අධ්‍යාපන අමාත්‍යාංශයේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන අංශයේ මෙහෙයවීමෙන්

සැලකිය යුතුයි :

- ***සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.***
- ***නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.***

සියලුම හිමිකම් ඇවිරිණි

1. පහත ප්‍රකාශ අතුරින් සුක්ෂම ආර්ථික විද්‍යාවට අයත් යථානුරූපී ප්‍රකාශය කුමක් ද?

(1) සමස්ත ඉල්ලුම ඉහළ යන විට මිල මට්ටම ඉහළ යයි.

(2) වැය කළ හැකි ආදායම පහළ යන විට පෞද්ගලික ඉතුරුම් පහළ යයි.

(3) රටක සාමාන්‍ය මිල මට්ටම 12% ඉක්මවීම ආර්ථිකමය වශයෙන් අහිතකරය.

(4) සාමාන්‍ය හාණ්ඩයක මිල ඉහළ යන විට එහි ඉල්ලුම් ප්‍රමාණය පහළ යයි.

(5) සාමාන්‍ය පොලී අනුපාතය ඉහළ යන විට ව්‍යාපාර ආයෝජන පහළ යයි.

2. පහත දැ අතුරින් ආර්ථික සම්පතක් සේ ගැනෙන්නේ,

(1) වී වගාවට යොදා ගන්නා මෝසම් වර්ෂාව.

(2) පපඩම් වියළීමට යොදා ගන්නා හිරුඑළිය.

(3) සූර්ය බලශක්තිය නිපදවීමට යොදා ගන්නා හිරුඑළිය.

(4) ජල විදුලිය නිපදවීමට භාවිත කරන ගංගා ජලය.

(5) ආහාර සැකසීමට යොදා ගන්නා සූර්ය තාපයෙන් ජනනයකල බල ශක්තිය.

3. තිරස් අක්ෂයේ x හාණ්ඩ ද සිරස් අක්ෂයේ y හාණ්ඩ ද දැක්වෙන නිෂ්පාදන හැකියා මායිමක නිමැවුම් සංයෝග කිහිපයක් පහත දැක්වේ.

x හාණ්ඩ	y හාණ්ඩ
0	50
40	40
70	30
85	20
95	10
100	0

මෙම තොරතුරු අනුව

(1) සෑම නිමවුම් මට්ටමකදී ම ආවස්ථික පිරිවැය ස්ථාවර අගයක් ගනී.

(2) x හා y හාණ්ඩ නිපදවීමට යොදා ගන්නා නාක්ෂණය සෑම අතින්ම සමාන වේ.

(3) x හාණ්ඩය සඳහා යොදාගනු ලබන සම්පත් y හාණ්ඩයට ද පුර්ණ ආදේශක වේ.

(4) මායිම් වක්‍රය දිගේ ඉහළට යන විට ආවස්ථික පිරිවැය අනුපාතය ක්‍රමයෙන් ඉහළ යනු ඇත.

(5) මායිම් වක්‍රය දිගේ ඉහළට යනවිට ආවස්ථික පිරිවැය අනුපාතය ක්‍රමයෙන් පහළ යනු ඇත.

4. " සම්පත් බෙදියාමේ කාර්යක්ෂමතාව" සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) සමාජ වරණයට අනුකූල වන ආකාරයට හාණ්ඩ හා සේවා සංයෝග නිපදවීමට හිහ සම්පත් බෙදා හැරීමය.
(2) දරිද්‍රතාව අවම වන ආකාරයට හාණ්ඩ නිපදවීම සඳහා සම්පත් බෙදා හැරීමය.
(3) මිල අඩු සම්පත් වැඩියෙන් හා මිල වැඩි සම්පත් අඩුවෙන් යොදා ගන්නා නිෂ්පාදන ක්‍රමය තෝරා ගැනීමය.
(4) ආදායම් බෙදියාමේ විෂමතාවය අවම වන ආකාරයට සම්පත් නිෂ්පාදන කාර්යයන් අතර බෙදා හැරීමය.
(5) යෙදවුම් ඒකකයකින් උපරිම නිමවුමක් ලැබෙනසේ නිෂ්පාදන කටයුතු සංවිධානය කිරීමය.

5. මිල ක්‍රමය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) ඉල්ලුම් හා සැපයුම් බලවේග මත හාණ්ඩ හා සේවා මිල ගණන් තීරණය වීමේ ක්‍රමය යි.
(2) ඉල්ලුම් හා සැපයුම් බලවේග මත නිෂ්පාදන සාධක මිල ගණන් තීරණය වීමේ ක්‍රමය යි.
(3) ඉල්ලුම් හා සැපයුම් බලවේග මත හාණ්ඩ හා සේවා සහ නිෂ්පාදන සාධක මිල ගණන් තීරණය වීමේ ක්‍රමය යි.
(4) ඉල්ලුම් හා සැපයුම් බලවේග මත තීරණය වන මිල මගින් නිෂ්පාදිතය බෙදා හැරීමේ ක්‍රමය යි.
(5) නිදහසේ තීරණය වන මිල පදනම් කරගෙන මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ ක්‍රමය යි.

6. නිෂ්පාදනය කරන්නේ කෙසේද යන ප්‍රශ්නය වෙළෙඳපොළ ආර්ථිකයක් විසින් විසඳනු ලබන්නේ,

(1) නිෂ්පාදන සාධක වෙළෙඳපොළ ලබා දෙන මිල සංඥා වෙත දක්වන ප්‍රතිචාර මගිනි.
(2) හාණ්ඩ වෙළෙඳපොළ ලබා දෙන මිල සංඥා වෙත දක්වන ප්‍රතිචාර මගිනි.
(3) රජයේ විධාන වෙත පොදු ව්‍යවසායයන් දක්වන ප්‍රතිචාර මගිනි.
(4) සාධාරණ ආදායම් ව්‍යාප්ති ඉලක්ක සපුරාලීම සඳහා සුදානම් කළ ප්‍රතිපත්ති වෙත දක්වන ප්‍රතිචාර මගිනි.
(5) අවම වැටුප් සහ පාලිත පොළී අනුපාතයන් මත පෞද්ගලික ව්‍යසායකත්වය දක්වන ප්‍රතිචාර මගිනි.


7. සීනි සඳහා ඉල්ලුම් වක්‍රය වම්පසට විතැන් වීමට හේතුවක් වනුයේ,

(1) සීනි මිල පහළ යාම ය.
(2) හකුරු මිල ඉහළ යාම ය.
(3) තේ කොළ මිල ඉහළ යාම ය.
(4) සීනි නිෂ්පාදන පිරිවැය පහළ යාම ය.
(5) සීනි පරිභෝජනය කරන ජනතාවගේ ආදායම් ඉහළ යාම ය.

8. සාමාන්‍ය හාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය වැඩි වීමට බලපානු ලබන්නේ පහත සඳහන් කවර හේතුව ද?

(1) සළකා බලන හාණ්ඩය සඳහා පාරිභෝගික රුචිය වැඩිවීම සහ ආදේශන හාණ්ඩ මිල වැඩිවීම.
(2) පාරිභෝගිකයින්ගේ මුදල් ආදායම වැඩිවීම හා ආදේශන හාණ්ඩවල මිල ඉහළ යාම.
(3) පාරිභෝගිකයින්ගේ මුදල් ආදායම හා එම හාණ්ඩයේ සාපේක්ෂ මිල ඉහළ යාම.
(4) පාරිභෝගිකයින්ගේ මූර්ත ආදායම හා ආදේශන හාණ්ඩවල මිල ඉහළ යාම.
(5) එම හාණ්ඩයේ සාපේක්ෂ මිල පහළයාම සහ එමගින් හටගත් මූර්ත ආදායම ඉහළයාම.


9. එක්තරා හාණ්ඩයක ඉල්ලුම් වක්‍රය පහත රූපයේ නිරූපනය කරන අතර එම ඉල්ලුම් වක්‍රයේ මධ්‍ය ලක්ෂ්‍යය A මගින් දැක්වේ.



ඉහත ඉල්ලුම් වක්‍රය සම්බන්ධයෙන් වඩාත් ම නිවැරදි ප්‍රකාශය කුමක්වේ ද?

(1) P_1 ට පහළ මිල ගණන් යටතේ මිල ඉල්ලුම් නම්‍යතාව එකට අඩු අගයක් ගන්නා අතර මිල පහළ යන විට ව්‍යාපාරික අයහාරය ඉහළ යයි.
(2) P_1 ට ඉහළ මිල ගණන් යටතේ මිල ඉල්ලුම් නම්‍යතාව එකට වැඩි අගයක් ගන්නා අතර මිල ඉහළ යන විට ව්‍යාපාරික අයහාරය පහළ යයි.
(3) P_1 ට පහළ මිල ගණන් යටතේ මිල ඉල්ලුම් නම්‍යතාව එකට වැඩි අගයක් ගන්නා අතර මිල පහළ යන විට ව්‍යාපාරික අයහාරය පහළ යයි.
(4) P_1 ට ඉහළ මිල ගණන් යටතේ මිල ඉල්ලුම් නම්‍යතාව එකට අඩු අගයක් ගන්නා අතර මිල පහළ යන විට ව්‍යාපාරික අයහාරය ඉහළ යයි.
(5) P_1 ට පහළ මිල ගණන් යටතේ මිල ඉල්ලුම් නම්‍යතාව එකට අඩු අගයක් ගන්නා අතර මිල ඉහළ යන විට ව්‍යාපාරික අයහාරය පහළ යයි.

10.



S_1 හා S_2 සැපයුම් වක්‍ර සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය සත්‍යවේ ද ?

S_1 සැපයුම් වක්‍රයේ සෑම ලක්ෂ්‍යයකදීම නම්‍යතාව	**S_2 සැපයුම් වක්‍රය දිගේ ඉහළට ගමන් කරන විට නම්‍යතාව**
(1) ඒකීය වේ.	එකට ආසන්න වන තෙක් පහළ යයි.
(2) ඒකීය වේ.	එකට ආසන්න වන තෙක් ඉහළ යයි.
(3) එකට අඩුවේ.	එකට ආසන්න වන තෙක් පහළ යයි.
(4) එකට වැඩිවේ.	එකට ආසන්න වන තෙක් ඉහළ යයි.
(5) ඒකීය වේ	ක්‍රමයෙන් වැඩි වේ.

11. කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා වූ ඉල්ලුම් වක්‍රයේ සමීකරණය Qd = 60- 5P වේ. මෙම භාණ්ඩයේ පළමු කන්නයේ දී සමස්ත සැපයුම ඒකක 30ක් වූ අතර දෙවැනි කන්නයේ දී සැපයුම ඒකක 40ක් විය. මෙම තොරතුරු අනුව දෙවැනි කන්නයේ දී පාරිභෝගික අතිරික්තය වැඩිවූ ප්‍රමාණය

(1) 35 කි. (2) 70 කි. (3) 90 කි. (4). 160 කි. (5) 180 කි.

12. එක්තරා භාණ්ඩයක් රුපියල් 20 බැගින් ඒකක 400ක් අලෙවි කළ අතර මිල රු. 30 දක්වා වැඩිවූ පසු අලෙවි ප්‍රමාණය ඒකක 200 දක්වා අඩුවිය. මෙම සිදුවීමට පහත සඳහන් කවර සාධකය හේතුවනු ලැබේ ද?

(1) ආදේශන භාණ්ඩයක මිල පහළ යාම.
(2) අනුපූරක භාණ්ඩයක මිල පහළ යාම.
(3) සලකා බලන භාණ්ඩය මත රජය බද්දක් පැනවීම.
(4) සලකා බලන භාණ්ඩය මත රජය සහනාධාරයක් සැපයීම.
(5) පාරිභෝගික රුචිය පහළ යාම.


13. සාමාන්‍ය ඉල්ලුම් හා සැපයුම් තත්වයක් පවතින භාණ්ඩයක නිෂ්පාදකයකු මත නිශ්චිත බද්දක් පැනවූ විට වෙළෙඳපොළේ ඇතිවන වෙනස්වීම් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද ?

	පාරිභෝගික අතිරික්තය	**නිෂ්පාදන අතිරික්තය**	**සමාජ ශුභසාධනය**
(1)	අඩුවේ	වැඩිවේ	අඩුවේ
(2)	වැඩිවේ	වැඩිවේ	අඩුවේ
(3)	අඩුවේ	අඩුවේ	බලපෑමක් නැත
(4)	අඩුවේ	අඩුවේ	අඩුවේ
(5)	අඩුවේ	අඩුවේ	වැඩිවේ

14. වෙළෙඳපොළේ අලෙවි වන සාමාන්‍ය ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් පවතින නාණ්ඩයක් අලෙවි කළ යුතු උපරිම මිල රජය විසින් නියම කළ අතර කළු කඩ මිලක් ඇති වීමට කිසිදු ඉඩක් නොදෙන ලදී. උපරිම මිල නියම කිරීමෙන් පසු අනිවාර්යයෙන් වෙළෙඳපොළේ සිදු විය හැකි සංසිද්ධීන් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

	පාරිභෝගිකයා ගෙවිය යුතු මිල	**නිෂ්පාදකයාට ලැබෙන මිල**	**සමාජ ශුභසාධනය**
(1)	පහළ යාම	ඉහළ යාම	පහළ යාම.
(2)	පහළ යාම	පහළ යාම	පහළ යාම.
(3)	පහළ යාම	පහළ යාම	ඉහළ යාම.
(4)	පහළ යාම	ඉහළ යාම	ඉහළ යාම.
(5)	පහළ යාම	වෙනසක් සිදු නොවීම	පහළ යාම.

15. පහත රූපයේ දැක්වෙන්නේ රජය විසින් සහතික මිල නියම කොට අධි සැපයුම් මිලදී ගැනීම මගින් මිල ආධාරක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන අවස්ථාවකි.




ඉහත රූප සටහනට අනුව සහතික මිල නියම කළ පසු පහත කවර පිළිතුර නිවැරදිවේ ද?

	රජය දරන වියදම	**ආර්ථික අතිරික්තය වැඩි වූ ප්‍රමාණය**	**අහිමි වන සමාජ ශුභසාධනය**
(1)	600	160	80
(2)	400	80	80
(3)	400	80	160
(4)	400	80	320
(5)	600	160	320


උපකුසුම අධ්‍යාපන

16. පහත රූප සටහනෙන් දැක්වෙන්නේ නිෂ්පාදන ක්‍රියාවලියකට අදාළ ආන්තික නිෂ්පාදනය හැසිරෙන ආකාරය වේ. මෙම වක්‍රයට අදාළ නිවැරදි ප්‍රකාශය කුමක් ද?



(1) විචල්‍ය යෙදවුම් L_1 දක්වා වැඩි කරන විට ආන්තික නිෂ්පාදිතයට වඩා සාමාන්‍ය නිෂ්පාදිතය ඉහළින් පිහිටයි.
(2) විචල්‍ය යෙදවුම් L_2 ට වඩා වැඩි කරන විට ආයතනයේ මුළු නිෂ්පාදිතය වැඩි වේ.
(3) L_2 විචල්‍ය යෙදවුම් මට්ටමේ දී මුළු නිෂ්පාදිතය උපරිම වේ.
(4) විචල්‍ය යෙදවුම් L_1 දක්වා වැඩි කරන විට හීනවන ආන්තික ඵලදා නීතිය ක්‍රියාත්මක වේ.
(5) L_1 සිට L_2 දක්වා විචල්‍ය යෙදවුම් වැඩි කරන විට මුළු නිෂ්පාදිතය ක්‍රමයෙන් පහළ යයි.

17. පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක කෙටිකාලීන නිෂ්පාදන පිරිවැය වක්‍ර පහත රූප සටහනින් දැක්වේ.



රූප සටහනේ දැක්වෙන තොරතුරුවලට අනුව මෙම ආයතනය විසින් ගත යුතු වැදගත් ම තීරණය කුමක් ද ?

(1) Q_2 දක්වා නිමවුම වැඩි කිරීමෙන් ලාභය උපරිම කරගත යුතුය.
(2) ආන්තික පිරිවැය හා සාමාන්‍ය පිරිවැය සමාන වන Q_3 නිමවුම නිෂ්පාදනය කළ යුතුය.
(3) Q_3 නිමවුමට වඩා නිමවුම වැඩි කළ යුතුය.
(4) නිෂ්පාදනය අත්හිටුවිය යුතුය.
(5) ආයතනය Q_1 නිමවුම් මට්ටමේ නිරතවෙමින් අලාභ අවම කළ යුතුය.


18. පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක කෙටිකාලීන පිරිවැය පිළිබඳ තොරතුරු පහත ලේඛනයෙන් දැක්වේ.

නිමවුම (ඒකක)	**ආන්තික පිරිවැය (රුපියල්)**
1	50
2	30
3	10
4	14
5	26
6	40

මෙම ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය රුපියල් 40ක් වේ නම් නිමවුම ඒකක 4 දී සාමාන්‍ය පිරිවැය රුපියල්

(1) **3.50** කි. (2) **10** කි. (3) **14** කි. (4) **26** කි. (5) **36** කි.

19.



ඉහත රූප සටහනේ A සිට B දක්වා නිෂ්පාදන ලක්ෂ්‍යය මාරුවන විට පහත සඳහන් කවර ප්‍රකාශය නිවැරදිවේ ද?

සමාහාර ඉල්ලුම වෙනස්වන ආකාරය	**උද්ධමන හෝ අවධමන ප්‍රවනතාව**
(1) ඉහළයාම	උද්ධමනයකි
(2) ඉහළයාම	අවධමනයකි
(3) පහළයාම	අවධමනයකි
(4) පහළයාම	උද්ධමනයකි
(5) පහළයාම	නිරුද්ධමනයකි

20. ජාතික ගිණුම් පිළියෙල කිරීමේ දී පහත සඳහන් කවරක් ඇතුළත් කරනු ලැබේ ද?

(1) තමන් පදිංචිව සිටි නිවස රු. ලක්ෂ **20** කට විකිණීම.
(2) වගා කටයුතු සඳහා ඉඩමක් මිලයට ගැනීම.
(3) කොටස් වෙළෙඳපොළෙන් කොටස් මිලයට ගැනීම.
(4) දේපල සමාගමකින් අළුත් නිවසක් මිලයට ගැනීම.
(5) රජයේ භාණ්ඩාගාර බිල්පත් මිලයට ගැනීම.

21. පහත දැක්වෙන්නේ කල්පිත ආර්ථිකයක් පිළිබඳ දත්ත කිහිපයකි.

ශුද්ධ දේශීය ආදායම	20 000
විදේශ ශුද්ධ සාධක ආදායම	-500
ප්‍රාග්ධන ක්ෂයවීම්	4 000
ශුද්ධ වකුගඩු	800

මෙම තොරතුරු අනුව වෙළෙඳ මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතය වන්නේ.

(1) 16.300 (2) 19.200 (3) 19.500 (4) 24.000 (5) 24.300

22. ජාතික ඉතුරුම් ගණනය කරන ආකාරය දැක්වෙන නිවැරදි ක්‍රමය කවරේ ද?

(1) දේශීය ඉතුරුම් + විදේශ ශුද්ධ සාධක ආදායම + විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම = ජාතික ඉතුරුම්
(2) දේශීය ඉතුරුම් - විදේශ ශුද්ධ සාධක ආදායම + විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම = ජාතික ඉතුරුම්
(3) දේශීය ඉතුරුම් + විදේශ ශුද්ධ සාධක ආදායම - විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම = ජාතික ඉතුරුම්
(4) දේශීය ඉතුරුම් + විදේශ ශුද්ධ සාධක ආදායම - රාජ්‍ය ඉතුරුම් = ජාතික ඉතුරුම්
(5) දේශීය ඉතුරුම් - පෞද්ගලික ඉතුරුම් + රාජ්‍ය ඉතුරුම් = ජාතික ඉතුරුම්

23. ආදායම 2000 දී සාමාන්‍ය පරිභෝජන නැමියාව 0.8 ක් වන අතර ආදායම 4000 දී සාමාන්‍ය පරිභෝජන නැමියාව 0.7 කි. මෙම සරල ආර්ථිකයේ ඉතුරුම් ශ්‍රිතය වනුයේ

(1) S = -400 + 0.8Y (2) S = 400+0.2Y (3) S = -400 + 0.2Y (4) S = -400 + 0.4Y (5) S= -400 + 0.3Y

24. ආන්තික පරිභෝජන නැමියාව 0.75 වන (MPC = 0.75) ආර්ථිකයක් පූර්ණ සේවා නියුක්ති සමතුලිත නිමැවුම් මට්ටමක් කරා ළඟා වීමට නිෂ්පාදනය රු. .බිලියන .600 න් වැඩි කළ යුතුය. ඒ සඳහා ආයෝජනය කොපමණ ප්‍රමාණයකින් වැඩි කළ යුතු ද?

(1) රු.බි. 15 කිනි. (2) රු.බි. 75 කිනි.
(3) රු.බි. 150 කිනි. (4) රු.බි. 300 කිනි. (5) රු.බි. 600 කිනි.

25. ස්වාධීන බදු පමණක් සහිත ආර්ථිකයක සමතුලිත නිමවුම් මට්ටම රු.මි. 1760/- ක් වන අතර පහත තොරතුරු ද සපයා ඇත.

C = 300+0.75yd I = 100 T = 100


මෙම ආර්ථිකයේ රජයේ පරිභෝජන වියදම් වන්නේ. රු. බිලියන.

(1) 100 කි. (2) 115 කි. (3) 300 කි. (4) 325 කි. (5) 375 කි.

26. මුදල් ප්‍රමාණවාදී න්‍යාය පැහැදිලි කිරීමේ දී ස්ථාවරව පවතින්නේ යැයි සිතා ගැනෙනුයේ,

(1) මුදල් සැපයුම හා මූර්ත නිමැවුම යි.
(2) පවත්නා මිල අනුව ජාතික නිෂ්පාදිතය හා මිල මට්ටම යි.
(3) මුදල් සැපයුම හා මුදලේ සංසරණ ප්‍රවේගය යි.
(4) මුදල් සැපයුම හා මිල මට්ටම යි.
(5) ගනුදෙනු ප්‍රමාණය හා මුදලේ සංසරණ ප්‍රවේගය යි.

27. ආර්ථිකයේ පූර්ණ සේවා නියුක්තියට අදාළ නිමැවුම් මට්ටම Y_F වන අතර දැනට පවතින සමස්ත ව්‍යදම E_0 වේ.



ඉහත රූප සටහන අනුව අවධමන පරතරය සහ ඊට බලපෑ හැකි සාධකය නිවැරදිව පෙළගැස්වූ පිළිතුර කුමක් ද?

	අවධමන පරතරය	**ඊට බලපෑ සාධක**
(1)	A - C	මුදල් සැපයුම් වැඩිවීම.
(2)	A - B	මුදල් සැපයුම් අඩුවීම.
(3)	A - B	මුදල් සැපයුම් වැඩිවීම.
(4)	A - C	මුදල් සැපයුම් අඩුවීම.
(5)	A - B	පොළී අනුපාතය අඩු වීම.

28. සමස්ත මුදල් ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීමට බලපාන හේතුවක් වනුයේ,

(1) පොළී අනුපාතිකය ඉහළ යාම.
(2) පිළිණපත් මිල පහළ යාම.
(3) පුද්ගලික ආදායම පහළ යාම.
(4) ආදායම් ලැබීමේ කාල පරාසය කෙටි වීම.
(5) ආදායම් මට්ටම ඉහළ යාම.

29. එක්තරා ආර්ථිකයකට අදාළව පහත තොරතුරු ඔබට සපයා ඇත.

මහ බැංකුව තුළ ඇති වාණිජ බැංකු තැන්පතු	100
මහජනයා සතු ව්‍යවහාර මුදල්	250
වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්	50
වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු	200
වාණිජ බැංකු වෙතැති කාලීන හා ඉතුරුම් තැන්පතු	1450
මුළු අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු	150
විදේශ ව්‍යවහාර බැංකු ඒකක තුළ නේවාසික තැන්පතු	200

ඉහත දත්ත වලට අදාළව පටු මුදල් හා පුළුල් මුදල් ගුණකයන් වන්නේ,

	M_1 පටු මුදල් ගුණකය	**M_2 පුළුල් මුදල් ගුණකය**
(1)	0.7	4.3
(2)	0.9	4.75
(3)	1.1	4.75
(4)	4.70	5.6
(5)	4.75	1.1

30. එක්තරා ආර්ථිකයක් පිළිබඳ පහත දැක්වෙන තොරතුරු ඔබට සපයා ඇත. මහජනයා සතු ව්‍යවහාර මුදල් නොගය රු.1000/- කි. වාණිජ බැංකු විසින් පවත්වා ගත යුතු යැයි මහ බැංකුව විසින් නියම කරන ලද සංචිත අනුපාතය 10% කි. වාණිජ බැංකු පද්ධතියට අදාළ ශේෂ පත්‍රය මෙසේය.

මූළු තැන්පතු	1000	සංචිත	125
		ණය	875
	1000		1000

ඉහත බැංකු පද්ධතියේ අඩි සංචිත ශූන්‍ය වන තෙක් ණය ප්‍රසාරණය කළ හොත් බැංකු පද්ධතියේ මූළු තැන්පතු ප්‍රමාණය හා එම අවස්ථාවේ දී පටු මුදල් සැපයුම (M_1) කොපමණ ද?

	මූළු තැන්පතු ප්‍රමාණය	**පටු මුදල් සැපයුම (M_1)**
(1)	1250	2250
(2)	1125	2125
(3)	1250	1250
(4)	2250	3250
(5)	2250	1250

31. පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) භාණ්ඩාගාර බිල්පත් ප්‍රති විකුණුම් අනුපාතිකය, පොළී අනුපාත කොරිඩෝවේ පහළ සීමාව නිරූපනය කරයි.

(2) මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව පවත්වා ගැනීම හේතු කොට ගෙන පොළී අනුපාත කොරිඩෝවේ ඉහළ හා පහළ සීමා අතර පරතරය පුළුල්වේ.

(3) මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් ඉහළයාම මුදල් පදනම සංකෝචනය වීමට හේතු වේ.

(4) මහ බැංකුව විසින් වාණිජ බැංකු සතු සුරුකුම්පත් මිලට ගැනීමෙන් බැංකු පද්ධතිය තුළ සංචිත ප්‍රමාණය පහළ යයි.

(5) අන්තර් බැංකු භාණ්ඩාගාර බිල්පත් නුවමාරුව නිසා බැංකු පද්ධතිය තුළ සංචිත ප්‍රමාණය වෙනස් නො වේ.

32. වෙළෙඳපොළ අසාර්ථක වීමට හේතු වන්නේ,

(1) පෞද්ගලික පිරිවැය හා පෞද්ගලික ප්‍රතිලාභ අතර වෙනසක් නොපැවතීම ය.


(2) පෞද්ගලික පිරිවැය හා සමාජ ප්‍රතිලාභ අතර වෙනසක් නොපැවතීම ය.

(3) පෞද්ගලික ප්‍රතිලාභ හා සමාජ පිරිවැය අතර වෙනසක් නොපැවතීම ය.

(4) පෞද්ගලික පිරිවැය හා සමාජ පිරිවැය අතර වෙනසක් පැවතීම ය.

(5) පෞද්ගලික පිරිවැය හා පෞද්ගලික ප්‍රතිලාභ අතර තුලිතබවක් පැවතීම ය.

33. පහත දැක්වෙන්නේ වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ හුවමාරු වන යම් භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් තත්වයන්ය.



ඉහත රූප සටහන අනුව බාහිරතා මූලාශ්‍රය, බාහිර පිරිවැය හෝ ප්‍රතිලාභය සහ සමාජය සම්බන්ධයෙන් ප්‍රශස්ත පරිභෝජනය නිවැරදිව පෙළ ගස්වා ඇති පිළිතුර වනුයේ,

	බාහිරතා මූලාශ්‍රය	**බාහිර පිරිවැය හෝ ප්‍රතිලාභය**	**ප්‍රශස්ත පරිභෝජනය**
(1)	නිෂ්පාදනයේ ධන බාහිරතාවකි	$P_3 - P_1$ බාහිර ප්‍රතිලාභයකි	Q_1
(2)	නිෂ්පාදනයේ සෘණ බාහිරතාවකි	$P_3 - P_2$ බාහිර පිරිවැයකි	Q_2
(3)	පරිභෝජනයේ ධන බාහිරතාවකි	$P_4 - P_2$ බාහිර ප්‍රතිලාභයකි	Q_1
(4)	පරිභෝජනයේ සෘණ බාහිරතාවකි	$P_4 - P_2$ බාහිර පිරිවැයකි	Q_1
(5)	පරිභෝජනයේ සෘණ බාහිරතාවකි	$P_3 - P_1$ බාහිර පිරිවැයකි	Q_2

34 ආර්ථික වර්ගීකරණය අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යදම් ව්‍යුහය නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක් ද ?

(1)	භාණ්ඩ හා සේවා	පොළී ගෙවීම්	වර්තන සංක්‍රාමණ
(2)	වර්තන ව්‍යදම	ප්‍රාග්ධන ව්‍යදම	ශුද්ධ ණය දීම්
(3)	සාමාන්‍ය පොදු සේවා	සමාජ සේවා	ආර්ථික සේවා
(4)	භාණ්ඩ හා සේවා	සමාජ සේවා	ආර්ථික සේවා
(5)	ප්‍රාග්ධන ව්‍යදම්	සංක්‍රාම ව්‍යදම්	පොළී ගෙවීම්

35. රජය විසින් කිසියම් භාණ්ඩයක් සඳහා බදු පැනවීම නිසා අධි බදු බර බිහිවන්නේ,

(1) සමස්ත බදු බරින් වැඩි කොටසක් නිෂ්පාදකයා දරන විටදී ය.
(2) සමස්ත බදු බරින් වැඩි කොටසක් පාරිභෝගිකයා දරන විටදී ය.
(3) නිෂ්පාදන අතිරික්තයේ වෙනස් වීමක් සිදු නොවන විටදී ය.
(4) ආර්ථික අතිරික්තයට හානි සිදුවන විටදී ය.
(5) පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තය ඉහළයාමක් සිදුවන විටදී ය.

36. පහත සඳහන් තොරතුරු යොදා ගනිමින් රාජ්‍ය අයවැයේ ප්‍රාථමික ගිණුමේ ශේෂයත් වර්තන ගිණුමේ ශේෂයත් ගණනය කරන්න.

බදු ආදායම	800
පොළී ගෙවීම්	280
ප්‍රාග්ධන වියදම්	520
වර්තන වියදම්	850
බදු නොවන ආදායම්	100

	ප්‍රාථමික ගිණුමේ ශේෂය	වර්තන ගිණුමේ ශේෂය
(1)	-470	-380
(2)	270	330
(3)	-190	-350
(4)	-190	50
(5)	-50	190

37. තිරිඟු හා රෙදි නිපදවන X හා Y රටවල තිරිඟු ඒකකයක් නිපදවීමට අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය හා රෙදි ඒකකයක් නිපදවීම සඳහා අවශ්‍ය ශ්‍රම පැය ගණන පහත දැක්වේ.

	X රට	Y රට
තිරිඟු ඒකකයක් නිපදවීමට ශ්‍රම පැය	5	8
රෙදි ඒකකයක් නිපදවීමට ශ්‍රම පැය	2	4

ඉහත තොරතුරු අනුව වඩාත් නිවැරදි පිළිතුර වනුයේ.
(1) රෙදි නිපදවීමේ නිරපේක්ෂ වාසිය Y රටට හිමි වේ.
(2) තිරිඟු නිපදවීමේ සාපේක්ෂ වාසිය X රටට හිමි වේ.
(3) තිරඟු නිපදවීමේ නිරපේක්ෂ වාසිය Y රටට හිමි වේ.
(4) තිරිඟු නිපදවීමේ සාපේක්ෂ වාසිය X රටට ඇති අතර රෙදි නිපදවීමේ සාපේක්ෂ වාසිය Y රටට හිමි වේ.
(5) තිරිඟු නිපදවීමේ සාපේක්ෂ වාසිය Y රටට ඇති අතර රෙදි නිපදවීමේ සාපේක්ෂ වාසිය X රටට හිමි වේ.

38. විදේශ වෙළෙඳාම හා සම්බන්ධ කල්පිත තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

අපනයන මිල දර්ශකය	120
අපනයන පරිමා දර්ශකය	125
ආනයන මිල දර්ශකය	150
අපනයන වටිනාකම් දර්ශකය	175

ඉහත තොරතුරු අනුව හාණ්ඩ වෙළෙඳ අනුපාතය හා ආදායම් වෙළෙඳ අනුපාතය නිවැරදිව දැක්වෙන පිළිතුර වනුයේ,

	හාණ්ඩ වෙළෙඳ අනුපාතය	ආදායම් වෙළෙඳ අනුපාතය
(1)	116	125
(2)	116	83
(3)	80	116
(4)	80	65
(5)	68	83


39. ගෙවුම් ශේෂ ලේඛනය හා සම්බන්ධ කල්පිත තොරතුරු සාරාංශයක් පහත දැක්වේ.

අයිතම	වටිනාකම (රු. බිලියන)
අපනයන	24
වෙළෙඳ ගිණුමේ ශේෂය	-23
සේවා ගිණුමේ ශේෂය	6
ආයෝජන ආදායම් ශුද්ධ අගය	-12
මූල්‍ය වෙනස්වීම්	15

ඉහත තොරතුරු අනුව දෘශ්‍ය ආනයන අගය සහ ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ ශේෂය වනුයේ,

	දෘශ්‍ය ආනයනය	**ප්‍රාග්ධන හා හා මූල්‍ය ගිණුමේ ශේෂය**
(1)	47	14
(2)	47	-14
(3)	42	6
(4)	37	15
(5)	1	-15

40. විදේශ විනිමය සඳහා වූ ඉල්ලුම වෙනස්වීම මත විදේශ විනිමය අනුපාතය වෙනස්වන ආකාරය පහත රූපයේ නිරූපනය කරයි.



ඉහත වෙනස්වීමට පාදක විය හැක්කේ පහත දැක්වෙන කවර සිදුවීම ද?

(1) වෙළෙඳ හවුල්කරුවන්ගේ රටවලට සාපේක්ෂව දේශීය මිල මට්ටම පහළ යාම.
(2) වෙළෙඳ හවුල්කරුවන්ගේ රටවලට සාපේක්ෂව දේශීය මිල මට්ටම ඉහළ යාම.
(3) දේශීය මිල මට්ටමට සාපේක්ෂව වෙළෙඳ හවුල්කරුවන්ගේ මිල මට්ටම ඉහළ යාම.
(4) ශ්‍රී ලංකාවේ අපනයනවල තරගකාරීත්වය ඉහළ යාම.
(5) ශ්‍රී ලංකාවේ අපනයන සැකසුම් කර්මාන්ත ප්‍රසාරණය වීම.

41. ගෝලීයකරණයට එරෙහිව සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙතින් එල්ලවන ප්‍රබලතම තර්කය වනුයේ,

(1) ප්‍රතිලාභ විෂම ලෙස ව්‍යාප්ත වේ යන්න යි.
(2) රටක ඇතිවන ආර්ථික අර්බුද සෙසු රටවලට ඉක්මණින් ව්‍යාප්ත වේ යන්න යි.
(3) දේශීය සාර්ව ආර්ථික කළමනාකරණය දුෂ්කර වේ යන්න යි.
(4) ශීඝ්‍ර කාර්මීකරණය නිසා පරිසර දූෂණය වේගවත් වේ යන්න යි.
(5) ජාත්‍යන්තර නුස්තවාදය හා මත්ද්‍රව්‍ය ජාවාරම් ව්‍යාප්තිය බහුලවේ යන්න යි.

42. කිසියම් රටක නාමික දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය 8% ක් ද, උද්ධමන අනුපාතය 4.6% ක් ද, ජනගහන වර්ධන වේගය 1.4% ක් ද වේ නම් මූර්ත දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතාත්මක වර්ධනය ආසන්න වශයෙන්

(1) 1% කි. (2) 2% කි. (3) 3.4% කි. (4) 4.3% කි. (5) 6.6% කි.

43. රටක ජීවන තත්වය පහත වැටීමට බලපානුයේ,

(1) ජනගහනය වැඩිවනවාට වඩා අඩු වේගයකින් ආදායම ඉහළ යාම යි.
(2) ජනගහනය වැඩිවනවාට වඩා වැඩි වේගයකින් මිල මට්ටම පහළ යාම යි.
(3) දළ ජාතික නිෂ්පාදනය ස්ථාවරව පවතිද්දී ජනගහනය අඩුවීම යි.
(4) ජනගහනය වැඩිවනවාට වඩා වැඩි වේගයකින් දළ දේශීය නිෂ්පාදනය ඉහළ යාම යි.
(5) දළ දේශීය නිෂ්පාදනය හා ජනගහනය ස්ථාවරව පැවතීම යි.

44. ගිනි සංගුණකය මගින් මනිනු ලබන්නේ,

(1) නිරපේක්ෂ දරිද්‍රතා මට්ටම යි.
(2) ආදායම් ව්‍යාප්ති විශමතාවය යි.
(3) අන්තර් දරිද්‍රතාවයේ මට්ටම යි.
(4) ආර්ථික වෘද්ධි මට්ටම යි.
(5) ආර්ථික ස්ථායිතාව යි.

45. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජනගහන දරිද්‍රතා දර්ශකය හා ග්‍රාමීය අංශයේ දරිද්‍රතාව නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

	ජනගහන දරිද්‍රතා දර්ශකය	ග්‍රාමීය අංශයේ දරිද්‍රතාව
(1)	15.7	6.7
(2)	11.4	8.9
(3)	9.4	5.3
(4)	8.9	5.3
(5)	8.9	9.4

46. ශ්‍රී ලංකාවේ ජනගහන ඝනත්වය වැඩිම දිස්ත්‍රික්ක පහ පිළිවෙලින්

(1) කොළඹ, ගාල්ල, මහනුවර, ගම්පහ, කෑගල්ල.
(2) කොළඹ, ගම්පහ , කළුතර, ගාල්ල, මහනුවර.
(3) කොළඹ, මහනුවර, ගාල්ල, කළුතර, ගම්පහ.
(4) කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, ගාල්ල.
(5) කොළඹ, ගාල්ල, ගම්පහ, මහනුවර, කුරුණෑගල.

47. කිසියම් රටක ජනගහනය මිලියන 20ක් ද වැඩ කරන වයසේ ජන සංඛ්‍යාව මිලියන 12ක් ද සේවා නියුක්ති ජනගහනය මිලියන 8ක් ද සේවා වියුක්ති ජනගහනය මිලියන 2ක් ද වේ නම් ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය හා සේවා වියුක්ති ජන සංඛ්‍යා අනුපාතය පිළිවෙලින්

(1) 40% හා 10 % කි.
(2) 60% හා 83 % කි.
(3) 83% හා 20 % කි.
(4) 60% හා 20 % කි.
(5) 50% හා 10 % කි.

48. 2012 වසරේ ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකය සහ එම දර්ශකය අනුව ශ්‍රී ලංකාව හිමි කරගත් ස්ථානය කුමක් ද?

	මානව සංවර්ධන දර්ශකය(HDI)	හිමිකරගත් ස්ථානය
(1)	0.669	92
(2)	0.791	92
(3)	0.715	92
(4)	0.695	97
(5)	0.675	97

49. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක "රන් දොර" වැඩසටහන මගින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කරනු ලබන වැඩසටහන් වන්නේ,

(1) බලශක්තිය නැංවීම. වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධනය.
(2) මහාමාර්ග. වාරිමාර්ග හා මග නැගුම්.
(3) වරාය හා ගුවන් තොටුපොළ. අධිවේගී මාර්ග හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ.
(4) ජල සම්පාදනය හා සනීපාරක්ෂාව. ගැම් දිරිය. ගැම් පුබුදුව.
(5) ගම නැගුම්. මග නැගුම්. ගැම් දිරිය. ගැම් පුබුදුව.

50. සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ තුළ මෙතෙක් ශ්‍රී ලංකාව සපුරා **නොගත්** ඉලක්කයක් වන්නේ,

(1) සැමට ප්‍රාථමික අධ්‍යාපනය ලබා දීම.
(2) කෘෂි නොවන ක්ෂේත්‍රයන්හි වැටුප් උපයන රැකියාවන්හි නියුක්ත කාන්තා ප්‍රතිශතය ඉහළ නැංවීම.
(3) වයස අවු. 5ට අඩු ළමයින්ගේ මරණ අනුපාතය අඩු කිරීම.
(4) වයස අවුරුදු 1ට අඩු ළමුන් අතුරින් සරම්ප රෝගයට ඒන්නත් ලබාගත් ප්‍රතිශතය ඉහළ නැංවීම.
(5) ළදරු මරණ අනුපාතය අඩු කිරීම.

***